“සැබැවින්ම මැතිරීම්, සුරය එල්ලීම් හා වශී ගුරුකම් ෂිර්ක් හෙවත් දේව ආදේශයකි.”

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) කළ ප්රකාශයකට තමන් සවන් දුන් බව පවසමින් අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. “සැබැවින්ම මැතිරීම්, සුරය එල්ලීම් හා වශී ගුරුකම් ෂිර්ක් හෙවත් දේව
ආදේශයකි.”
[صحيح] [رواه أبو داود وابن ماجه وأحمد]

ෂිර්ක් හෙවත් දේවත්වයට ආදේශ තැබීමේ ඇතැම් කරුණු සම්බන්ධයෙන් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් පැහැදිළි කර සිටියි. ඒවා අතරින්: පළමුවැන්න: මැතිරීම: දේවත්වයට ආදේශ කිරීම මත පදනම් ව අඥාන ජනයා සුවය පතා ජප කරමින් සිටි ඇතැම් ප්රකාශය. දෙවැන්න: පබළු හා ඒ හා සමාන දැයින් යුක්ත සුරය එල්ලීම: ඇස්වහ දුරු කිරීම සඳහා දරුවන් හා සතුන්ට ඒවා පළන්දවනු ලැබේ. තුන්වැන්න: වශී ගුරුකම්: සැමියා සහ බිරිද යන දෙදෙනා අතර එකකු අනෙකාට ආදරය කිරීම සඳහා සිදු කරනු ලබන්නකි. මෙම කරුණු ෂිර්ක් හෙවත් අල්ලාහ්ට ආදේශ තබන කරුණු අතුරිනි. මක්නිසාද යත් එය යමක් හේතුවක් කර ගැනීමකි. එය සාක්ෂි මගින් ඔප්පු කරන ලද ආගමික හේතු සාධකයක් හෝ අත්දැකීමෙන් ඔප්පු කරන ලද භෞතික හේතු සාධකයක් නොවන බැවිනි. අල් කුර්ආනය කියවීම වැනි ආගමික හේතු සාධක හෝ අත් දැකීම් තුළින් සහතික වූ ප්රතිකාර ක්රම මෙන් භෞතික හේතු සාධක වනාහි, සැබැවින්ම ඒවා හේතු සාධක වන අතර සැබැවින්ම යහපත හා හානිය අල්ලාහ්ගේ අතෙහි පවතින බවට වූ විශ්වාසය සමග අනුමත කරුණකි.

http://www.sunnah.global/hadeeth/si/show/5273